# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## නිර්වින්දන වෛද්‍ය විශේෂඥ තනතුර

## ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ හෘද උරස් ශල්‍ය ඒකකය යනු වැඩිහිටි අයගේ ශල්‍යකර්ම ඉහළ ප්‍රමාණයකින් එනම් වසරකට 500 කට අධික ප්‍රමාණයක් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හෘද උරස් ශල්‍ය ඒකකයක් වේ. මෙම ඒකකය සතුව ඇඳන් 12 කින් යුත් ICU ඒකකයක් ද, ඇඳන් 06 කින් යුත් HDU ඒකකයන් ද පවතී. තෝරා ගනු ලබන අයදුම්කරු එදිනෙදා ඉටුකළ යුතු රාජකාරීවලට අමතරව හෘද උරස් ICU/ HDU (Cardio Thoracic) ඒකකයන්හි ප්‍රධානී ලෙසද කටයුතු කළ යුතුය. එහෙයින් ඉහත ක්ෂේත්‍රයේ පළපුරුද්ද සතුවීම, අමතර සුදුසුකමක් වේ.

**සුදුසුකම්** : නිර්වින්දන වෛද්‍ය PGIM මණ්ඩල සහතිකය (Board Certification in Anaesthesia)

**හෝ**

නිර්වින්දන වෛද්‍ය මණ්ඩල සහතිකය සඳහා සුදුසුකම් සතුවීම.

- විශ්‍රාමික නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන් ද සලකා බැලේ.

**වැටුප් පරිමාණය** : වැටුප සාකච්ඡා කළ හැක.

**රැකියාව සඳහා නියමයන්** : අර්ථ සාධක අරමුදල් පදනමිනි.

රජයේ සේවයේ තනතුරු හොබවන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ.

මෙම තනතුරට යම් අයකු පත්කිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව සතුවේ.

අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් විසින්, සම්පූර්ණ ජීව දත්ත සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම් ඇතුළත් අයදුම්පත්, පහත සඳහන් අය වෙත, 2021.04.27 වන දින හෝ එදිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2021.04.08**